# බෞද්ධ ධනය කළමනාකරණ මූලධර්ම තුළින් මානසික නිදහසට ඇතිවන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්; ඉණ සූත්‍රය ඇසුරෙන්

**සියඹලාවැව යායේ ධම්මසාරිණී මෙහෙණින් වහන්සේ**[1]

## හැඳින්වීම

වර්තමාන වාණිජ ලෝකයේ මිනිසාගේ මානසික නිදහසට බලපෑම් කරන ආතතිය, කාංසාව සහ අතෘප්තිය වැනි තත්ත්ව ඇතිවීමට ප්‍රබල හේතුවක් ලෙස ධනය කළමනාකරණය නොකිරීම හඳුනාගත හැකි ය. එහෙත්, බෞද්ධ ඉගැන්වීම් තුළින් පුද්ගල ධනය ඉපැයීමේ ක්‍රම ශිල්ප, සදාචාරාත්මක හැසිරීම සහ පරිභෝජන ආකාර තුළින් ධනය කළමනාකරණය සඳහා මඟපෙන්වීම් සිදුකරයි. මානසික නිදහස සම්බන්ධ මෙම අධ්‍යයනය ඉණ සූත්‍රය ආශ්‍රයෙන් ධනය කළමනාකරණය පිළිබඳ විශේෂයෙන් අවධානය යොමු කරමින් එම බෞද්ධ මූලධර්ම මානසික යහපැවැත්ම කෙරෙහි දක්වන බලපෑම ගවේෂණය කරයි. ඉණ සූත්‍රය මූල්‍ය වගකීම, සදාචාරාත්මක ධනය රැස් කිරීම සහ ණයෙන් වැළකීම සඳහා මාර්ගෝපදේශ ගෙනහැර දක්වන අතර එමඟින් මානසික සන්සුන්භාවය ළඟා කරගන්නා ආකාරය දක්වයි. අංගුත්තරනිකායේ අඩංගු මෙම සූත්‍රයේ මූලධර්ම විශ්ලේෂණය කිරීමෙන් වර්තමානයේ මූල්‍ය කරුණු සම්බන්ධයෙන් පුද්ගල සන්තානයේ ඇතිවන කාංසාව, ආතතිය හා අතෘප්තිය වැනි මානසික පීඩාවන් සමනය කර, සූත්‍රානුගත කරුණු ඇසුරෙන් ඵලදායී ලෙස බෞද්ධ ධනය කළමනාකරණ මූලධර්ම යොදාගෙන මානසික නිදහස ඇති කරගන්නා ආකාරය ගවේෂණය කරයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය පාලි ත්‍රිපිටකයේ අන්තර්ගත සූත්‍ර පිටක අඞ්ගුත්තරනිකායේ ඡක්ක නිපාතයේ අඩංගු ඉණ සූත්‍රයේ අර්ථකථන විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමු කළ ගුණාත්මක පර්යේෂණ සැලසුමක් භාවිත කරයි. පර්යේෂණය අරමුණු කරන්නේ සූත්‍රයේ දක්වා ඇති ධනය කළමනාකරණ මූලධර්ම ගවේෂණය කොට අර්ථ නිරූපණය තුළින් සූත්‍රානුගත මානසික නිදහස පිළිබඳ විශේෂයෙන් විමර්ශනය කිරීමයි. ධනය කළමනාකරණය, සදාචාරාත්මක ජීවන රටාව සහ මානසික යහපැවැත්ම පිළිබඳ ව සාකච්ඡා කරන අනෙකුත් අදාළ සූත්‍ර සමඟින් ඉණ සූත්‍රගත කරුණු ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් ප්‍රාථමික දත්ත රැස් කරනු ලැබේ. සූත්‍ර පාඨ පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගැනීම සඳහා සාම්ප්‍රදායික විවරණ සහිත අට්ඨකතා ද අධ්‍යයනයට ඇතුළත් කරනු ඇත. දත්ත විශ්ලේෂණයට මූලික නියමයන් සහ සංකල්ප අර්ථකථනය කිරීම ඇතුළත් <u>වනු ඇත. තව ද</u>, වර්තමාන ධන කළමනාකරණ මූලධර්ම සහ බෞද්ධ මූලධර්ම තුළින්

1. පළමු වසර, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැළණිය, 11600 ශ්‍රී ලංකාව.
dhammasarini@gmail.com

මානසික නිදහස ඇතිකරගත හැකි ආකාරය අතර සම්බන්ධය අනාවරණය කොට කරගනිමින් අර්ථකථනය කරීම අපේක්ෂිත ය. මෙම පර්යේෂණය සම්පූර්ණයෙන් ම ත්‍රිපිටකය හා සමගාමී පාඨමය මූලාශ්‍ර මත පදනම් වී ඇති බැවින්, මානව නියැදියක් අවශ්‍ය නොවේ. දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය සඳහා අපේක්ෂිත මූලික මෙවලම් අතර පාලි ග්‍රන්ථවල විවේචනාත්මක සංස්කරණ, ශාස්ත්‍රීය පරිවර්තන සහ සාම්ප්‍රදායික විවරණ ඇතුළත් වේ.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ඉණ සූත්‍රයේ කරුණු මගින් මානසික නිදහසට සහජයෙන්ම බැඳී පවතින ධනය කළමනාකරණයට අදාළ ප්‍රධාන මූලධර්ම කිහිපයක් හෙළි කරයි. මෙම මූලධර්ම අනුව පළමුවැන්න, ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ පස්වැන්න වන සම්මා ආජීව සංකල්පය අනුව ඉණ සූත්‍රයෙන් ධාර්මික මාර්ගයෙන් ධනය රැස් කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. දුරාචාර ක්‍රියාවන්, අධාර්මික ක්‍රියාවන් තුළින් උපයන ධනය මානසික අසහනයට හා කර්ම විපාකවලට හේතු වන බව පෙන්වා දෙමින් පුද්ගලයන්ට සදාචාර විරෝධී ක්‍රියාවන්හි නොයෙදීමට සූත්‍රය මගපෙන්වීම් කරයි. එම සංකල්ප තුළින්  පුද්ගලයාට මානසික නිදහස ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සදාචාරාත්මක ජීවන රටාව මූලික වන බවට වන බෞද්ධ මතය තවදුරටත් මෙයින් අවධාරණය කෙරේ.

දෙවැන්න ලෙස ඉණ සූත්‍රයේ සැලකිය යුතු කොටසක් ණයෙන් වැළකීම හෙවත් ණය හේතුවෙන් ඇතිවන දුෂ්කරතා දක්වයි. ණයෙන් නිදහස් වීම, බන්ධනයෙන් නිදහස් වීම හා සමාන බව බුදුරජාණන් වහන්සේ ද දේශනා කළහ. පර්යේෂණය දක්වන්නේ ණය, මූල්‍ය හා සදාචාරාත්මක යන දෙඅංශයෙන් ම මානසික ආතතිය ඇති කරමින්, මානසික නිදහසට බාධා කරන බව ය. සූත්‍රයේ ඇති මඟපෙන්වීම තුළින් ණය බරින් තොර වු, උපරිම මානසික සන්සුන් භාවයෙන් යුතුව ජීවත්වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශයක් ලෙස හඳුනාගත හැක.

පර්යේෂණයේ තෙවැනි කරුණ ලෙස, තණ්හාවට හෝ අධික ආශාවට යටත් නොවී තමා සතු දෙයින් තෘප්තිමත් වීම, ලද දෙයින් සතුටවීම මෙන් ම පහසුවෙන් පෝෂණය කිරීමට හැකිවීම ආදි ගුණ ධර්මයන් පූරණයට සූත්‍රය අනුබල දෙයි. මෙම මූලධර්ම සිතෙහි ඇතිවන තෘප්තිය හා අතෘප්තිය නිසා ඇතිවන මානසික තත්ත්ව හා ඍජුව ම සම්බන්ධ වේ. ඉණ සූත්‍රයේ ධන කළමනාකරණය පිළිබඳ බෞද්ධ මූලධර්ම මගින් මානසික නිදහස සාක්ෂාත් කර ගැනීම සඳහා පරිපූර්ණ ප්‍රවේශය, මූල්‍ය ආචාරධර්ම මනෝවිද්‍යාත්මක යහපැවැත්ම සමඟ බද්ධ කොට දක්වයි.

සූත්‍රයේ දක්වා ඇති පරිදි ධනය ධාර්මිකව රැස් කිරීම භෞතික ජීවිතයක් පවත්වා ගැනීමට පමණක් නොව සදාචාර විරෝධී ක්‍රියාවන් නිසා ඇතිවන මානසික ව්‍යාකූලත්වය වළක්වා ගැනීමට ද උපකාරී වේ. මෙයින් නිවැරදි ජීවනෝපාය (සම්මා ආජීව) අෂ්ටාංගික මාර්ගයට අත්‍යවශ්‍ය වන අතර එය දුක්ඛ නිරෝධයට හේතු වන බව බෞද්ධ මතය සපථ කරයි. ඉණ සූත්‍රයේ ණය වළක්වා ගැනීම පිළිබඳ අවධාරණය විශේෂයෙන් කැපී පෙනේ. ණය යනු කාංසාව සහ ආතතිය ඇතිවීමට ප්‍රධාන හේතුවකි. අනවශ්‍ය ණයෙන් මිදුණු ජීවන රටාවක් සඳහා සූක්ෂම මූල්‍ය කළමනාකරණය තුළින් මානසික නිදහස පවත්වා ගැනීමට ප්‍රායෝගික මඟ පෙන්වීමක් සූත්‍රය මඟින් සපයයි.

සූත්‍රයේ සාකච්ඡා කර ඇති පරිදි බුදුදහම, ධනය පසුපස අනවශ්‍ය ලෙස හඹා යෑම, ලුහුබැඳ යෑම අනුමත නොකරන අතර මානසික නිදහස සාක්ෂාත් කරගනු ලබන්නේ ධනය එක්රැස් කිරීමෙන් නොව තමා සතුව ඇති දෙයින් තෘප්තිමත් වීමෙනි. මෙය තෘප්තිය සහ මානසික යහපැවැත්ම අතර ශක්තිමත් සහසම්බන්ධයක් පෙන්නුම් කරන නවීන මනෝවිද්‍යාත්මක පර්යේෂණ සමඟ සමපාත වේ.

**නිගමනය**

ධනය කළමනාකරණය පිළිබඳ බෞද්ධ මූලධර්ම මානසික නිදහස සාක්ෂාත් කර ගැනීම සඳහා සැලකිය යුතු ලෙස දායක වන බව ඉණ සූත්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. මෙම සූත්‍රගත කරුණු විශ්ලේෂණය කිරීමෙන්, මෙම පර්යේෂණය තුළින් සදාචාරාත්මක ලෙස ධනය රැස් කිරීම, ණයෙන් වැළකීම සහ ලද දෙයින් තෘප්තිමත් වීම පිළිබඳ විවේචනාත්මක ඉගැන්වීම් හඳුනා ගත හැක. විශ්ලේෂික මූලධර්ම අනුව සැබෑ මානසික නිදහස ඇතිවන්නේ පුද්ගලයා සතු ද්‍රව්‍යවල හෝ ඔහු සතු ධනය ප්‍රමාණය භාවිත නොකොට ගබඩා කොට රඳවා තබාගැනීමෙන් නොව, උපයාගත් ධනය කළමනාකරණයෙන් යුතුව යහපත් ලෙස පරිභෝජනය තුළිනි. මෙම අධ්‍යනයෙන් පෙනී යන්නේ, මෙම ඉගැන්වීම් අදාළ කර ගැනීමෙන් මානසික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සහ සමකාලීන සන්දර්භයන් තුළ මූල්‍ය ආතතිය කළමනාකරණය කිරීම සඳහා වටිනා උපාය මාර්ග ලබා දිය හැකි බව යි. සමස්තය සලකා බැලීමේදී විද්‍යාමාන වන්නේ, ඉණ සූත්‍රය මානසික සෞඛ්‍යය සහ මූල්‍ය කළමනාකරණය සඳහා නවීන ප්‍රවේශයන් සමඟ සම්ප්‍රදායික බෞද්ධ ප්‍රඥාව ඒකාබද්ධ කිරීම සඳහා අර්ථවත් අවබෝධයක් සපයන බව යි.

**මුඛ්‍ය පදඃ** ඉණ සූත්‍රය, ධන කළමනාකරණය, ණය, මානසික ආතතිය, මානසික නිදහස

**ආශ්‍රිත ග්‍රන්ථ**

*අංගුත්තර නිකාය චතුර්ථ භාගය*. (2020). Taiwan: The corporate Body of The Buddha Educational Foundation.

*Mahavaggapali*. (2013). Dharma Chakkra Child Foundation.

Dipananda, D. (2015). A Buddhist Perspective on Economics and the Alleviation of Poverty. [online] Buddhistdoor.net. Available at: https://www2.buddhistdoor.net/features/a-buddhist-perspective-on-economics-and-the-alleviation-of-poverty [Accessed 30 Aug. 2024].

Kalupahana, D. (1979). The Socio- Economic Thought in Buddhism. Singapore: The Young Buddhist.

මද්දුමාගේ, මිල්ටන්. (2008). *තිරසාර සංවර්ධනයේ බෞද්ධ න්‍යාය*. මරදානඃ ගොඩගේ ප්‍රකාශන.